www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 8 වන කොටස

**The Historical and International Foundations of the Socialist Equality Party—Part 8**

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

## ව□කර්ස් ලීගය සමග වුල්ෆර්ත්ගේ බිඳීම

157. ලෝක ධනවාදයේ අර්බුදයත්, පන්ති ගැටුම ඉහල යාමත් හේතු කොට ගෙන ව'කර්ස් ලීගය තුල දේශපාලන ගැටලු මතුපිටට පැමිනියේ ය. 1960 ගනන් අවසානයේ හා 1970 ගනන් මුල, ලීගයේ වර්ධනය බොහෝ දුරට පදනම්ව තිබුනේ ශිෂ්‍යයන්ගේ හා සුලුජන තරුනයන්ගේ පෙරලිකාරිත්වය මතය. එහෙත්, එක්සත් ජනපද හමුදා වියට්නාමයෙන් ඉවත්වීමට පටන් ගැනීමත්, බලහත්කාරයෙන් බඳවා ගැනීමේ පනත අවසන් වීමත් හමුවේ විශ්ව විද්‍යාල පරිශ්‍රයන්හි දේශපාලන වාතාවරනය වෙනස් විය. ව'කර්ස්ලීගය හමුවේ දැන් මතුවූ අභියෝගය කම්කරු පන්තිය වෙත හැරීමයි. මේ සඳහා ප්‍රායෝගික කටයුතුවල පුලුල් වීමක් පමනක් නොව, සාපේක්ෂව අත්දැකීම් අඩු පක්ෂ සාමාජිකයන් විසින් පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහිව ජාත්‍යන්තර කමිටුව ගෙනගිය අරගලයේ පාඩම් උකහා ගැනීමත්, වෛෂයික තත්වය පිලිබඳ පූර්න මාක්ස්වාදී විශ්ලේෂනයත් අවශ්‍ය විය. ඒ වෙනුවට, වුල්ෆර්ත්ගේ මඟ පෙන්වීම යටතේ, පැහැදිලි දේශපාලන ඉදිරි දර්ශනයකින් තොර, බෙහෝකොට ම ක්‍රියාවාදී ස්වභාවයක් ගත් වැඩ කටයුතු පක්ෂයට භාර විය. වුල්ෆර්ත්ගේ දේශපාලන හා පෞද්ගලික හැසිරීම ප්‍රදර්ශනය කලේ, අවමංගතවීමේ අශුභ ලක්ෂන ය. නැන්සි ෆීල්ඩ්ස් නම් අලුත් පුද්ගලික සහකාරියගේ දිරිගැන්වීම් මත, පක්ෂය තුල වුල්ෆර්ත්ගේ මැදිහත්වීම් එන්ට එන්ටම සංත්‍රාසය, මූලධර්ම විරහිත කම හා විනාශකාරී ස්වභාවයක් ගත්තේය. 1973-74 අතර වසරක කාලය තුල ව'කර්ස් ලීගයට සිය සාමාජිකත්වයෙන් හරි අඩකට වැඩි ගනනක් අහිමි විය.

158. 1974 අගෝස්තු අග භාගයේ ව'කර්ස් ලීගයේ දේශපාලන අර්බුදය හිනි පෙත්තටම ලඟාවිය. කිසිදු අත්දැකීමකින් හෝ සුදුසුකමකින් තොර නැන්සි ෆීල්ඩ්ස්, වුල්ෆර්ත් විසින් නායකත්වයට උසස් කරන ලද අතර ඔහුගේ නොවෙන් කල හැකි සහකාරිය බවට පත්විය. නැන්සි ෆීල්ඩ්ස්ට මධ්‍යම රහස් ඔත්තු සේවයේ (සීඅයිඒ) ඉහල පුද්ගලයෙකු සමඟ කිට්ටු පවුල් සම්බන්ධකම් තිබෙන බව ජාත්‍යන්තර කමිටුව දැන ගත්තේය. මෙම පවුල් සම්බන්ධකම් ගැන වුල්ෆර්ත් දැන සිටිය ද, ව'කර්ස් ලීග් මධ්‍යම කමිටුවේ අනෙකුත් සියලු සාමාජිකයන්ගෙන් එම තොරතුරු වහංගු කල බව ඉන් පසුව හෙලි විය. 1974 මැයි මාසයේ ජාත්‍යන්තර කමිටුවේ සමුලුවට තමා සමඟ පැමිනීමට ඔහු ඇයව පුද්ගලිකව තෝරා ගෙන තිබුනු නමුදු, වුල්ෆර්ත් විසින් ජාත්‍යන්තර කමිටුවට නැන්සි ෆීල්ඩ්ස්ගේ පසුබිම දැනුම් දී නොතිබුනි. එම සමුලුවට සහභාගී වූ නියෝජිතයන් ගනනාවක් ම පැමින තිබුනේ දේශපාලන කටයුතු නීති විරෝධී තත්වයන් යටතේ ගෙනයාමට සිදුව තිබූ මර්දනකාරී තන්ත්‍රයන් පැවති රටවලිනි. ව'කර්ස් ලීගයේ මධ්‍යම කාරක සභාව, වුල්ෆර්ත් ජාතික ලේකම් තනතුරෙන් පහකිරීමට ඡන්දය දුන් අතර, ෆීල්ඩ්ස්ගේ පසුබිම ගැන පරීක්ෂනයක් කරන තුරු ඇයගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවන ලදී.[95] මසකට පසුව වුල්ෆර්ත් ව'කර්ස් ලීගයෙන් ඉල්ලා අස්වූ අතර, ඒ වහාම ජාත්‍යන්තර කමිටුව ප්‍රසිද්ධියේ හෙලාදුටුවේය. පෙර 14 වසරක් තිස්සේ තමන් ලියා ඇති සියල්ල ඉවත දමමින් ඔහු යලිත් සමාජවාදී කම්කරු පක්ෂයට එක්විය. අවසානයේ දී වුල්ෆර්ත්, සමාජවාදී දේශපාලනය මුලුමනින්ම හැර දමා. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය "කුලකයක්" ලෙස හෙලාදකිමින්, 1990 ගනන් අග භාගයේ "යුද්ධයට අවස්ථාවක් දෙන්න" යන ශීර්ෂයෙන් යුත් ලිපියකින් බෝල්කන්හි ඇමරිකානු මිලිටරි මැදිහත්වීමක් ඉල්ලා සිටියේය.

## වුල්ෆර්ත්ගෙන් පසුව ව□කර්ස් ලීගය

159. වුල්ෆර්ත්ගේ දේශපාලන පලායාම, ට්‍රොට්ස්කිවාදී සංවිධානයක් ලෙස ව'කර්ස් ලීගය වර්ධනය කිරීමේ සන්ධිස්ථානයක් සලකුනු කලේය. වුල්ෆර්ත්ගේ ඉල්ලා අස්වීම හා ඉන්පසු තමන්ගේ ම

දේශපාලන ඉතිහාසය හෙලාදැකීමෙන් ප්‍රකාශිත වන්නේ පුද්ගල දුබලතාවය පමනක් නොවේ. එය, ඇමරිකානු රැඩිකල්වාදයේ ලක්ෂන මූර්තිමත් කරයි. ඒ විශේෂයෙන් ම, න්‍යායික අඛන්ඩතාවය හා ඉතිහාසය කෙරෙහි අවඥා සහගත පිලිකුලයි. 1973-74 කාලය තුලින් තමන් පසුකර ආ අර්බුදය හඳුනා ගත් ව'කර්ස් ලීගය, වුල්ෆර්ත්ගේ වැරදි පිලිබඳ විවේචනයට වැඩි දෙයක් අවශ්‍ය බව වටහා ගත්තාය. එබැවින්, වුල්ෆර්ත්ගේ ඉල්ලා අස්වීමට හා හජාජාක සම්බන්ධ ඔහුගේ හෙලාදැකීමට ප්‍රතිචාර වශයෙන් ව'කර්ස් ලීගය, හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ විස්තෘත විශ්ලේෂනයකට මුල පිරීය. හරියට ම, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පිලිබඳ ඓතිහාසික අත්දැකීම, ලෝක ධනවාදයේ වෛෂයික වර්ධනයේ හා ජාත්‍යන්තර පන්ති අරගලයේ සන්දර්භය තුල බහා අවධාරනය කිරීම, විශිෂ්ට හා අත්‍යවශ්‍ය අංග ලක්ෂනය ලෙස ව'කර්ස් ලීගය තුල මතුව තිබුනි. මාක්ස්වාදී ඉදිරිදර්ශනය හා කම්කරු පන්තිය වෙත මූලෝපායික දිශානතියක් වර්ධනය කල හැක්කේ, මාක්ස්වාදී ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීමේ මුලු බර ම, සමකාලීන සමාජ-ආර්ථික ක්‍රියාවලීන් විශ්ලේෂනය තුලට ගෙන ඒමෙන් පමනක් බව එය පුන පුනා අවධාරනය කලේය. 1978 නොවැම්බර් මස සිය ඉදිරි දර්ශන යෝජනාව තුල ව'කර්ස් ලීගය මෙසේ පැවසීය...

> බලය සඳහා අරගලයේ දෘෂ්ටිකෝනයෙන්, කම්කරු පන්තිය වෙත ඕනෑම සැබෑ දිශානතියක් සඳහා බොඳකල නොහැකි පදනම, එනම් විප්ලවවාදී භාවිතය සඳහා අත්තිවාරම, 1953 පටන් ජාත්‍යන්තර කමිටුව පසුකර ආ ඓතිහාසික අත්දැකීම්වල සමස්ත ස්කන්ධය පූර්න වශයෙන් ජීර්නය කරගැනීම පමනි. ට්‍රොට්ස්කිවාදී කේඩරය පුහුනු කල හැක්කේ, සංශෝධනවාදයට එරෙහි අරගලයෙන් ජාත්‍යන්තර කමිටුව නෙලාගත් ඓතිහාසික ජයග්‍රහන මත, පක්ෂයේ දේශපාලන වැඩ කටයුතු පිලිබඳ සෑම අංශයක් හා විස්තරයක්ම පදනම් කිරීමට කරන අරගලයකින් පමනි.[96]

160. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම් පිලිබඳ මෙම සවිඥානක හා අඛන්ඩ යලි හැදෑරීමත්, තත්කාර්යවාදයට එරෙහි න්‍යායික අරගලය හා කම්කරු පන්තිය වෙත පක්ෂයේ ප්‍රායෝගික දිශානතියත්, යන දෙක අතර සම්බන්ධය මෙම ලියවිල්ලෙන් පැහැදිලි කෙරුනි.

> බොල්ශෙවික්වාදයේ වර්ධනය හා පන්තියේ වෛෂයික වූ ඓතිහාසික අත්දැකීම් සමස්තයේ අන්තර්ගතයෙන් ද, ප්‍රතිවිරුද්ධයන්ගේ එකමුතුවක් ලෙස විප්ලවවාදී පක්ෂය හා කම්කරු පන්තියේ වත්මන් අරගලයන් අතර ඓතිහාසික අඛන්ඩතාවයේ සීමා මායිම් සුරක්ෂිත කිරීම සඳහා කෙරෙන සවිඥානක අරගලයෙන් ද පිටස්තරව, කම්කරු පන්තිය වෙත සැබෑ හැරීමක් තිබිය නොහැකිය. සංශෝධනවාදයට එරෙහි අරගලයේ ඓතිහාසික දායාදය හා හතරවන ජාත්‍යන්තරයට ට්‍රොට්ස්කි ඉතිරිකර තැබූ උරුමය වන දැවැන්ත දේශපාලන හා න්‍යායික ප්‍රාග්ධනය මත, පක්ෂයේ සමස්ත වැඩ කටයුතු පදනම් කිරීමට ගෙනයන අරගලයේ දෘෂ්ටි ආස්ථානයේ සිට පමනකි, තත්කාර්යවාදයට එරෙහි සටන පක්ෂ කේඩරය තුලත්, එබැවින් කම්කරු පන්තියම තුලත් බැරෑරුම් ලෙස දියත්කල හැක්කේ. තත්කාර්යවාදයට එරෙහි අරගලය, කේඩරයේ දෛනික භාවිතයත්, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පසුකර ආ ඓතිහාසික අත්දැකීමේ සමස්ත ස්කන්ධයත් අතර සෘජු ඓතිහාසික සම්බන්ධය පවත්වා ගැනීම සඳහා කෙරෙන අරගලයෙන් වෙන්කල වහාම එය, වාචික ද්වන්ධ සටනේ අතිශය බෙලහීන ආකෘතිය තුලට දියවී යයි. නැත්නම් වඩාත් නිවැරදිව කිවහොත්, එය හුදෙක් තවත් තත්කාර්යවාදයක් බවට ම පත්වෙයි.[97]

## ‘ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය’ පිලිබඳ පරීක්ෂනයේ මූලාරම්භය

161. ව'කර්ස් ලීගය අතහැර වුල්ෆර්ත්ගේ පලායාම වටා ඇති සිදුවීම් තුල, ඉතිහාසය හා දේශපාලනය අන්තර් ඡේදනය වීමේ ප්‍රකාශනය අත්කර ගනී. ආරම්භයේ දී, නැන්සි ෆීල්ඩ්ගේ පවුල් සම්බන්ධකම් ජාත්‍යන්තර කමිටුවට හෝ ව'කර්ස් ලීගයේ නායකත්වයට දැනුම්දීමට තමන් අසමත් වූ බව ඔහු පිලිගත්ත ද, එය ව්‍යාපාරයේ ආරක්ෂාව බරපතල ලෙස කඩ කිරීමක් විය. ව'කර්ස් ලීගය හැරගිය වහාම ඔහු ප්‍රකාශ කලේ, පක්ෂය විසින් මතුකල සැක සාංකාවලට යන්තම් හෝ යුක්තිසහගත භාවයක් නොතිබුනු බවයි. ආරක්ෂාව පිලිබඳ ජෙරී හීලිගේ පූර්ව සංකල්පිත සැක, උමතුභාවය පිලිබඳ සාක්ෂි බව වුල්ෆර්ත් ප්‍රකාශ කලේය. එස්ඩබ්ලිව්පී ප්‍රධාන දේශපාලන නායක හා පැබ්ලෝවාදී ඉන්ටර් කොන්ටිනන්ටල් ප්‍රෙස් සඟරාවේ කර්තෘ ජෝසප් හැන්සන් කටුක ලෙස හීලි හෙලාදකිමින්, වුල්ෆර්ත්ගේ ආධාරයට පැමිනියේය. "වුල්ෆර්ත් හීලිගේ රඟදැක්ම උමතුවක් ලෙස විස්තර කරයි, එයට "පීඩනෝන්මාදය" වැනි නූතන යෙදුමක් භාවිතා කිරීම වඩාත් සිත්ගන්නා හා සංයුක්ත නොවන්නේද?" ඔහු ලිවීය.[98]

162. වුල්ෆර්ත්ගේ සහායට හැන්සන්ගේ මැදිහත්වීමෙන් අරමුනු කලේ. විප්ලවකාරී සමාජවාදී

ව්‍යාපාරය තුල ආරක්ෂාව පිලිබඳ අවශ්‍යතාව පහත් කොට තැකීම හා මෙම කාරනය බැරෑරුම්ව සැලකූ අය අපකීර්තියට පත් කිරීම ය. මේ තුලින් ප්‍රගාඪ දේශපාලන හා ඓතිහාසික වැදගත්කමක් ඇති ප්‍රශ්න මතුකරයි.

1. ඔහුගේ ම සංවිධානයේ ආරක්ෂාව ගැන වුල්ෆර්ත්ගේ නොසැලකිලිමත් ආකල්පය ආරක්ෂා කිරීමට හැන්සන් හොට දැම්මේ, නික්සන්ගේ ඉල්ලා අස්වීමෙන් පසුව රැඩිකල් හා සමාජවාදී සංවිධාන ගැන ආන්ඩුවේ දැවන්ත ඔත්තුබැලීම් පිලිබඳ ඉමහත් ප්‍රමානයක් තොරතුරු මතුවීමට පටන් ගෙන තිබූ මොහෙතක ය. හැන්සන්ගේ ම සංවිධානයත් වසර 15 කට ආසන්න කාලයක් පැතිර පැවති ඔත්තු බැලීමේ ක්‍රියාන්විතයක ඉලක්කයව තිබුනි. ජේ එඩ්ගා හූවර්ගේ අනුදැනුම යටතේ, එෆ්බීඅයි විසින් ගොඩනගා තිබුනු ඊනියා කොයින්ටෙල්ප්‍රෝ මෙහෙයුමට අදාල ලියවිලි හෙලිදරව් කලේ 1961-1975 කාලයේ එස්ඩබ්ලිව්පීය පොලිස් ඒජන්තයන්ගෙන් හා තොරතුරු සපයන්නන්ගෙන් පිරී පැවති බවයි.

2. හතරවන ජාත්‍යන්තරය, සෝවියට් සංගමයේ හා එක්සත් ජනපදයේ ඒජන්තයන් විසින් විනිවිදීමේ ප්‍රතිපලයක් ලෙස ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට විනාශකාරී පහරවල් එල්ල වී තිබේ. 1937-40 කාලයේ හතරවන ජාත්‍යන්තරයේ නායකත්වයෙහි සැලකිය යුතු කොටසකගේ ඝාතනයන් සූදානම් කර ක්‍රියාත්මක කලේ ව්‍යාපාරය විනිවිදි ස්ටැලින්වාදී ඒජන්තයන් විසිනි.

3. ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ආරක්ෂාව පිලිබඳ හීලිගේ උත්සුකය "පීඩනොන්මාදය" ලෙස පරිහාසයට ලක්කල හැන්සන්, 1940 අගෝස්තුවේ සෝවියට් ජීපීයූ ඒජන්තයෙකු වූ රේමොන් මර්කේඩර් විසින් සිදු කල ලියොන් ට්‍රොට්ස්කිගේ ඝාතනය අත්දුටු අයෙකි. ඝාතනය සිදුකල දින කොයෝවාකාන්හි ට්‍රොට්ස්කිගේ මැඳුරට ඇතුලුවීම සඳහා මර්කේඩර්ට අවසර දුන්නේ අන් කිසිවෙකු නොව හැන්සන්ය. ට්‍රොට්ස්කිට සමීපවීම සඳහා උපායක් ලෙස එස්ඩබ්ලිව්පීයේ තරුන සාමාජිකයෙකු සමඟ මර්කේඩර් පුද්ගලික සම්බන්ධයක් ගොඩනගාගෙන සිටි බව ද හැන්සන් දැන සිටියේය. ට්‍රොට්ස්කි ඝාතනයෙන් පසුව ජේම්ස් පී කැනන්, ට්‍රොට්ස්කිගේ පුද්ගලික ආරක්ෂාව අනතුරේ හෙලුවේ "නොසැලකිලිමත්කම" බව ඇඟවුම් කලේය. "අප මිනිසුන්ගේ අතීතය, ඉහල තනතුරුවල සිටි අයගේ පවා, ඇති තරම් ගැඹුරට හාරා අවුස්සා නැත, - ඔවුන් පැමිනියේ කොහි සිට ද, ඔවුන් ජීවත් වන්නේ කෙසේ ද, ඔවුන් විවාහවී ඇත්තේ කා සමඟ ද යනාදිය - . විප්ලවවාදී ව්‍යාපාරයකට අ ආ වන මෙවන් ප්‍රශ්න අතීතයේ මතුවූ කවර අවස්ථාවක හෝ සුලු ධනපති විරුද්ධවාදීන් කෑගැසුවේ 'අහෝ දෙවියනි නුඹලා සහෝදර වරුන්ගේ පුද්ගලික ජීවිතය ආක්‍රමනය කරති' යනුවෙනි. සැබවි, අප හරියට ම කරමින් සිටින්නේ ඒ දෙයයි, වඩාත් නිවැරදිව කිවහොත් කිරීමට තර්ජනය කරන්නේ එයයි. අතීතයේ දී ඉන් කිසිවක් සොයාගත්තේ නැත. අප එවන් කරුනු තවත් ටිකක් සැලකිල්ලෙන් පරීක්ෂාකර තිබුනේ නම් ගතවූ දිනවල සමහර අශුභ දේවල් වලක්වාගත හැකිව තිබුනි. [99]

163. දී ඇති මෙම සන්දර්භය තුල හැන්සන් හීලිට එල්ල කරන ප්‍රහාරය නින්දිත වනවා පමනක් නොව, ධනේශ්වර රාජ්‍යයේ හා එහි ඒජන්තයන්ගේ සැබෑ තර්ජන හමුවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ සාමාජිකත්වය නිරායුධ කිරීමේ උත්සාහයකට නොඅඩු දෙයක් ද වේ. හැන්සන්ට හා වුල්ෆර්ත්ට දිය යුතු ඉතාම යෝග්‍ය පිලිතුර, ආරක්ෂාව පිලිබඳ ගැටලුවලට සම්බන්ධ හතරවන ජාත්‍යන්තරයේ ඓතිහාසික අත්දැකීම් සමාලෝචනය කිරීම බවට ජාත්‍යන්තර කමිටුව තීරනය කලේය. සුවිශේෂිතව මෙයට, ලියොන් ට්‍රොට්ස්කි ඝාතනයට මුල්වූ කරුනු ඇතුලත් වන්නේය. හතරවන ජාත්‍යන්තරය 1975 මැයි මාසයේ පැවැත්වූ සිය හයවන සමුලුවේ දී මෙම පරීක්ෂනයට මූලිකත්වය ගැනීම සඳහා ඡන්දය ප්‍රකාශ කලේය. එහි ප්‍රතිපල "ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය" යන මාතෘකාව යටතේ පලවූ පොතක් තුල ප්‍රකාශයට පත්කොට තිබේ.

## ජෝසෆ් හැන්සන්ගේ ක්‍රියාකලාපය

164. පරීක්ෂනයේ මූලික අදියරයන්හි දී සොයා ගත්, මෑතක දී ප්‍රසිද්ධියට පත්කල ලියවිලිවලින්, ට්‍රොට්ස්කිගේ ඝාතනය සූදානම් කල කුමන්ත්‍රනයේ හා හතරවන ජාත්‍යන්තරයේ ප්‍රධාන දේශපාලන මධ්‍යස්ථාන සියල්ල ම විනිවිදීමට සමත්වූ ඒජන්තයන් විසින් ඉටු කල මාරාන්තික ක්‍රියා කලාපයේ සුවිශාලත්වය හෙලිදරව් කලේ ය. හජාජාක, ට්‍රොට්ස්කිගේ පුත් ලියොන් සෙඩොව්ගේ ප්‍රධාන සහකරු බවට පත්වූ මාර්ක් ස්බොරොව්ස්කි වැනි ඒජන්තයන්ගේ කටයුතුවලට අදාල ලියවිලි සොයාගත්තේ ය. ස්බොරොව්ස්කි, සෙඩොව් හා යුරෝපය තුල හතරවන ජාත්‍යන්තරයේ අනෙකුත් ප්‍රමුඛ සාමාජිකයන් ඝාතනයේ දී, ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කලේ ය. ට්‍රොට්ස්කිගේ වැඩ කටයුතුවලට සම්බන්ධ වටිනා තොරතුරු ක්‍රෙම්ලිනයට සැපයූ තවත් වැදගත් ස්ටැලින්වාදී

ඒජන්තවරියක වූයේ ජේම්ස් පී කැනන්ගේ පුද්ගලික ලේකම්වරිය වූ සිල්වියා කෝල්ඩ්වෙල් ය (නී කැලන්). එහෙත් හජාජාක විසින් සොයාගත් වැදගත්ම තොරතුර ජෝසෆ් හැන්සන්ගේ වැඩ කටයුතුවලට සම්බන්ධය. එක්සත් ජනපද ජාතික ලේඛනාගාරයෙන් ලබා ගත්, ලියවිලි හා තොරතුරු පිලිබඳ පනත හරහා සොයා ගත් අනෙකුත් විස්තරවලින්, ට්‍රොට්ස්කි ඝාතනය කිරීමත් සමග ම වාගේ හැන්සන්, එක්සත් ජනපද ආන්ඩුවේ ඉහල පෙලේ ඒජනතයන් සමග රහසිගත සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට මග පාදාගත් බව හෙලිදරව් විය. එවන් එක් ලියවිල්ලක් වූයේ, මෙක්සිකෝ සිටි හි ඇමරිකානු තානාපති, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වෙත යැවූ ලිපියකි. 1940 සැප්තැම්බර් 25 දරන එම ලිපියෙන් වාර්තාකර තිබුනේ හැන්සන්, "පසු ප්‍රතිවිපාකයන්ගෙන් නිදහස්ව රහසිගත තොරතුරු ලබාදිය හැකි නිව් යෝර්ක්හි සිටින ඔබගේ විශ්වාසවන්තයෙකු සමග සබඳකම් පැවැත්වීමට කැමැත්තෙන් සිටින," බවය. [100]

165. හජාජාක පරීක්ෂනයෙන් සොයා ගත් බොහෝ වැදගත් කරුනු අතර, ඒකාන්ත වශයෙන්ම ජෝසෆ් හැන්සන් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල ඒජන්තයෙක් ලෙස කටයුතු කල බවට සාක්ෂි තිබේ. සමාජවාදී කම්කරු පක්ෂය තුල රජයේ විනිවිදීම හා පාලනය පිලිබඳව එක්සත් ජනපද ආන්ඩුවට එරෙහිව චෝදනා නගමින් ඇලන් ගෙල්ෆාන්ඩ් විසින් ගොනුකල නඩුවකින්, නිකුත් කිරීමට බලකෙරුනු නිල ලියවිලිවලින්, ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරයේ පරීක්ෂනයේ සොයාගැනීම් තහවුරු විය. නඩුවේ ප්‍රතිපලයක් ලෙස සොයා ගත් වඩාත් වැදගත් කරුනු අතර හැන්සන්, එස්ඩබ්ලිව්පීය තුල ජීපීයූව සඳහා වැඩ කරමින් සිටි බව - අඩුතරමින් 1940 මැදභාගයේ පටන් වත් - එෆ්බීඅයි විසින් දැන සිටි බව හෙලිවීම ද විය. ඔහු ස්ටැලින්වාදී ඒජන්තයෙකු ලෙස හඳුනා ගනු ලැබුවේ, සිල්වියා කෝල්ඩ්වෙල් (නී කැලන්) ප්‍රසිද්ධියේ හෙලිදරව් කල හිටපු කොමියුනිස්ට් පක්ෂ නායක ලුවී බුඩෙන්ස් ම ය. මෙම හෙලිදරව්ව, හැන්සන් හා එස්ඩබ්ලිව්පී නායකත්වය විසින්, එතරම් ම දැඩි ලෙස බුඩෙන්ස් හෙලා දැක්කේත්, කෝලඩ්වෙල් ආරක්ෂා කලේත්, මන්ද යන්න පැහැදිලි කරයි. කෝල්ඩ්වෙල්ට එරෙහිව බුඩෙන්ස්ගේ චෝදනා පිලිගැනීමෙන්, හැන්සන් ඒජන්තයෙක් ලෙස හඳුනාගත් බුඩෙන්ස්ගේ සාක්ෂියට සැලකිය යුතු විශ්වාසනීයත්වයක් ලැබීමක් වේ. එබැවින් ජූරිය සිල්වියා කෝල්ඩ්වෙල්ගේ අවසාන ජූරි දිව්රුම් ප්‍රකාශය නිකුත් කිරීමට නියෝග කරන තෙක් ම, - එහි දී ජීපීයූ ඔත්තු කාරිනියක් ලෙස තමා එස්ඩබ්ලිව්පීය ඇතුලත වැඩ කල බව ඇය පිලිගත්තා ය. - ආදර්ශමත් සහෝදරියක ලෙස එස්ඩබ්ලිව්පීය ඇය ආරක්ෂා කලේ ය. ජෝසෆ් හැන්සන්ගේ බිරිඳ වන රෙහා හැන්සන්, බුඩෙන්ස්ගේ හෙලිදරව්වන් ප්‍රසිද්ධියට පත්කල 1947 වසරේ ම, කෝල්ඩ්වෙල් හදිසියේ පක්ෂය හැරයාමට හේතු පිලිබඳව ප්‍රසිද්ධියේ බොරු ගෙතුවා ය. කෝල්ඩ්වෙල් "ප්‍රිය ජනක තැනැත්තියක" ලෙස විස්තර කරමින් රෙහා හැන්සන් කියා සිටියේ "1947 වසරේ සිල්වියා නිව් යෝර්ක් නගරයෙන් ඉවත් වූයේ පවුල් ප්‍රශ්න නිසා බව" ය. [101] ගෙල්ෆාන්ඩ් නඩුවේ දී දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් එස්ඩබ්ලිව්පී ජාතික ලේකම් ජැක් බාර්න්ස් කියාසිටියේ කෝල්ඩ්වෙල් " පසුගිය වසර දෙක පුරා ම හිරිහැරයට ලක්ව සිටින අතර එසේ වීමෙන් පසුව ඇය මගේ වීරවරියක් බවට" පත්ව සිටින බවයි. [102]

## වංචනික තීන්දුවක් ස්ටැලින්වාදී අපරාධ වසංකිරීමට පැබ්ලෝවාදීහු අනුමැතිය පලකරති

166. හජාජාක විසින් සොයාගත් සාක්ෂි තිබියදී ම, සියලු අවස්ථාවාදීන් හා පැබ්ලෝවාදී සංවිධාන ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරයේ පරීක්ෂනයට විරුද්ධ වූහ. 1976 සැප්තැම්බරයේ දී පැබ්ලෝවාදී ව්‍යාපාරයේ සෑම ප්‍රමුඛ පුද්ගලයෙකුම පාහේ ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය "නිර්ලජ්ජිත කුමන්ත්‍රනයක්" ලෙස හෙලා දකිමින් ඊනියා "තීන්දුව" නිකුත් කලහ. පසුව "තීන්දුව" පිලිබඳ ප්‍රකාශයට වගකිව යුතු එස්ඩබ්ලිව්පී නිලධාරීන්ගෙන් ගෙල්ෆාන්ඩ් ලබාගත් ප්‍රකාශයන් ගෙන් පැහැදිලි වූයේ එයට අත්සන් තැබූ කිසිවෙකුත්, "ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය" හෙලාදැකීමට සිය නම් ඇතුලත් කිරීමට පෙර හජාජාක විසින් එකතු කල සාක්ෂි කිසිවක් සමාලෝචනය කර නොතිබුනු බවයි. සාක්ෂි විභාග කිරීමට විධිමත් පරීක්ෂන කොමිසමක් පිහිටුවීමට ජාත්‍යන්තර කමිටුව විසින් යලි යලිත් නිකුත්කල කැඳවුම්වලට පිලිතුරු නොලැබුනි. දේශපාලන අවශ්‍යතාවන්, පැබ්ලෝවාදී ප්‍රතිචාරය තුල තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටුකලේය. ට්‍රොට්ස්කි ඝාතනය පිලිබඳ ප්‍රශ්නය සිහිපත් කිරීමේ හා ස්ටැලින්වාදී අපරාධයන්ගේ ඉතිහාසය කම්කරුවන්ගේ නව පරම්පරාවක අවධානයට යොමු කිරීමේ අවශ්‍යතාවක් ඔවුනට නොවීය. සමාජවාදී කම්කරු පක්ෂය විනිවිදීමට සම්බන්ධ ප්‍රශ්නවලට පිලිතුරු දෙන ලෙස, ස්බොරොව්ස්කිට බලකරමින් ගෙල්ෆාන්ඩ් ලබාගත් සිතාසිය නිෂ්ප්‍රභා කිරීම සඳහා ජීපීයූ ඝාතකයා වන මාර්ක් ස්බොරෙව්ස්කි දැරූ උත්සාහයට සහයෝගය පලකරමින් එස්ඩබ්ලිව්පීය, 1983 දී උසාවියේ පෙනීසිටි විට ද ඔවුන් එයට විරුද්ධ වූයේ ද නැත. සැන්ෆ්‍රැන්සිස්කෝහි සුව පහසු නිවාඩුවක් ගතකරමින් සිටි ස්බොරෙව්ස්කි, එස්ඩබ්ලිව්පීය තුල ඒජන්තයන් හෙලිදරව් කිරීමට දායක වන දිවුරුම් ප්‍රකාශයක්, මෑතක සම්මත කල රහසිගත තොරතුරුවල කඩතොලුවලින් ආරක්ෂා කිරීමේ පනත උල්ලංගනය කිරීමට හේතුවනු ඇතැයි යන පදනම මත සිතාසියට අභියෝග කල අතර, අධිකරනය ස්බොරොව්ස්කිගේ ඉල්ලීමට ඉඩ ලබා දුන්නේය.

167. ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරයේ පරීක්ෂනය අවසන්වී ගතවූ සියවස් කාලක් තුල එහි බොහෝ සොයාගැනීම්, නිල සෝවියට් ලිපි ලේඛන නිකුත්වීමෙන් පසුව සනාථ වී ඇත. ඊනියා "වෙනෝනා ලිපි ලේඛන" යනුවෙන් හඳුන්වන, සෝවියට් බුද්ධි අංශවලින් මුදාහල ලිපි ගොනු අනුව කෝල්ඩ්වෙල් පමනක් නොව ආරක්ෂකයෙකු ලෙස සේවය කිරීම සඳහා මෙක්සිකෝවට යවනු ලැබූ එස්ඩබ්ලිව්පී සාමාජිකයෙක් වූ රොබර්ට් ෂෙල්ඩන් හාර්ට් ද ස්ටැලින්වාදී ඒජන්තයෙක් විය. හාර්ට්ට චෝදනා එල්ල කරමින් හජාජාක මුලින් තොරතුරු ප්‍රකාශයට පත්කල විට, එයද මඩගැසීමක් ලෙස පැබ්ලෝවාදීන් හා එස්ඩබ්ලිව්පීය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුනි. හජාජාක විසින් එල්ල කල චෝදනාවල වලංගුභාවය, ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය පිලිබඳ පැබ්ලෝවාදීන්ගේ හෙලාදැකීම් ඉල්ලා අස්කර ගැනීමකට නම් හේතුවක් වූයේ නැත. කිසිදු පැබ්ලෝවාදී සංවිධානයක් එසේ කලේ නැත.

168. ආරක්ෂාව පිලිබඳ පරීක්ෂනයේ අතුරු ඵලයක් ලෙස තවත් අසාමාන්‍ය තොරතුරු ගොන්නක් මතුවිය. සමාජවාදී කම්කරු පක්ෂයේ දේශපාලන කමිටුවේ බහුතරයක් ද ඇතුලු මධ්‍යම නායකත්වය මුලුමනින්ම පාහේ, මිඩ්වෙස්ට්හි කුඩා ලිබරල් කලා පාසැලක් වූ කාල්ටන් විද්‍යාලයේ ඉගෙනුම ලබා ඇති බව හෙලිවිය. 1960-64 අතර කාලයේ කාල්ටන් පරිශ්‍රයෙහි කුමන හෝ ක්‍රමානුකූල වැඩක එස්ඩබ්ලිව්පීය යෙදී සිටි බවට වාර්තා නැත. ජැක් බාර්න්ස් ද ඇතුලු බොහෝ සිසුන් පක්ෂට පැමින ඇත්තේ මෙම කාලය තුලය. ඔවුහු ඉක්මනින්ම නායකත්වය දක්වා ම උසස් වූහ. ජැක් බාන්ස් රිපබ්ලිකානුවෙක් ව සිටි මිඩ්වෙස්ට් හි සිසුන් කන්ඩායමක් විප්ලවවාදී සංවිධානයක් බව කියාගත් එස්ඩබ්ලිව්පීයේ නායකයන් වූයේ එෆ්බීඅයි ඒජන්තයන් විසින් ගසාකෑ හා කාවැදීගත් කියුබානු කොමිටියේ කටයුතු තුලින්ය. කාල්ටන් විද්‍යාලීය සංසිද්ධිය සඳහා කිසිදු පිලිගතහැකි පිලිතුරක් එස්ඩබ්ලිව්පී නායකයන් විසින් සපයා නැත.

169. ජාත්‍යන්තර කමිටුවේ පරීක්ෂනයෙන්. හැන්සන් ඒජන්තයෙකු බව පෙන්නුම් කෙරෙන තවත් බොහෝ සාපරාධී තොරතුරු සොයාගන්නා විට, එස්ඩබ්ලිව්පී හා පැබ්ලෝවාදීන් එයට විරුද්ධව ගෙනගිය උද්ඝෝෂනය වඩ වඩාත් ප්‍රකෝපකාරී ස්වභාවයක් ගත්තේය. 1977 ජනවාරි 14 වන දින ලංඩන්හි දී පැබ්ලෝවාදීන් සිය අධාරකරුවන් ද සමඟ ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වමින් ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරය ද විශේෂයෙන්ම ජෙරී හිලි ද හෙලාදුටහ. සභාව ඇමතු අය අතර අර්නස්ට් මැන්ඩෙල්, බ්‍රිතාන්‍ය පැබ්ලෝවාදී සංවිධානයේ ප්‍රධානියා වූ තරික් අලී, ඕසීඅයි හි නායක පියරේ ලැම්බර්ට් හා ටිම් වුල්ෆර්ත් වූහ. රැස්වීමට පෙරාතුව, කම්කරු විප්ලවවාදී පක්ෂය, පරීක්ෂනයෙන් සොයාගත් සාක්ෂි විභාග කිරීම සඳහා එක්සත් ලේකම් මන්ඩලයේ හා හජාජාක සමාන සාමාජිකයන්ගෙන් සැදුම්ලත් සාදෘෂ්‍ය කමිටුවක් පත්කිරීම වෙනුවෙන් කැඳවුමක්, පැබ්ලෝවාදී සංවිධානවල නායකයන් වෙත, ලිපියක් මගින් යොමු කලේය. ලිපියට පිලිතුරු නොලැබුනි. ජනවාරි 14 රැස්වීමේ දී එය සලකා බැලුනේ ද නැත. ඒ වෙනුවට රැස්වීම තුල සිදුවූයේ හීලි පිලිබඳව මුලුමනින්ම අවලාද සහගත හෙලාදැකීමකි, හීලි, මෙම ප්‍රහාරයන්ට පිලිතුරු දීම සඳහා අවස්ථාවක් දෙන ලෙස ඉල්ලමින් සභාව තුල නැගීසිටි විට පැබ්ලෝවාදී සංවිධායකයින් එය ප්‍රතික්ෂේප කලහ.

170. පැබ්ලෝවාදීන්ගේ බාධාකිරීම් මධ්‍යයේ පරීක්ෂනය දිගටම පැවැත්වුනි. 1977 මැයි මාසයේ දී හජාජාක, චිකාගෝවෙන් පිටත කුඩා නගරයක, නිශ්චිත ලිපිනයක් රහිතව චාරිකා රථ ගාලක ජීවත්වන සිල්වියා කෝල්ඩ්වෙල් හඳුනා ගත්තේය. ස්ටැලින්වාදී ඒජන්තයෙකු වූ ඇගේ පලමු සැමියා 1958 දී මිය ගියේය. එස්ඩබ්ලිව්පීය හැර යාමෙන් පසුව යලි විවාහවූ ඇය, දැන් පෙනී සිටින්නේ සිල්වියා ඩොක්සි ලෙස ය. එස්ඩබ්ලිව්පී සාමාජිකාවක් ලෙස සිටි බව අමතක යයි කියා සිටින ගමන්ම ඇය, ජේම්ස් පී කැනන් විශේෂිතව වැදගත්වූ පුද්ගලයෙකු නොවන බව ද ප්‍රකාශ කලාය. ඇයගේ සාකච්ඡාව ඇතුලත් වාර්තාවෙන් කොටසක් ඇයගේ ඡායාරූප ද සමඟ ජාත්‍යන්තර කමිටුව විසින් 1977 ජූනි මාසයේදී ප්‍රසිද්ධියට පත් කලේය. එස්ඩබ්ලිව්පීය මෙයට ප්‍රතිචාර දැක්වූයේ ව'කර්ස් ලීගය "ප්‍රචන්ඩ" සංවිධානයක් ලෙස හංවඩු ගැසීමට දැරූ උත්සාහයක් ද සමඟ, ප්‍රසිද්ධ උද්ඝෝෂනයකිනි. හැන්සන් විසින්ම මෙම උද්ඝෝෂනයට මුල පිරුවේ පරීක්ෂනය, ජාත්‍යන්තර කමිටුවට "මාරක ප්‍රතිවිපාක" ගෙනදිය හැකි බවට අනතුරු අඟවමිනි. ඔහු මෙසේ ලිවීය. "කම්කරු ව්‍යාපාරයේ අනෙකුත් කොටස්වලට විරුද්ධව කායික ප්‍රහාරවලට මුලපිරීමේ හැකියාව හීලිවාදීන් සතුව තිබේ..."[103] "ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය" "ප්‍රචන්ඩ" යයි හෙලාදකින අතරම එයට විරුද්ධව කායික ප්‍රහාර පවා සූදානම් කිරීමේ විශේෂ ක්‍රමවේදය දිගු කලක් තිස්සේ ස්ටැලින්වාදීන් සතුව තිබේ. සිව් මසකට පසුව 1977 ඔක්තෝබර් 16 වන දින, වර්කර්ස් ලීගයේ ප්‍රමුඛ සාමාජිකයෙක් වූ ටොම් හෙනහන්, තරුන සමාජවාදියෝ නම් එහි තරුන සංවිධානයේ ප්‍රසිද්ධ දේශපාලන කටයුත්තක් මෙහෙයවමින් සිටියදී, නිව් යෝර්ක් නගරයේ දී වෙඩි ප්‍රහාරයකට ලක් විය. තුවාල හේතුවෙන් පැය කිහිපයකට පසුව ආරෝග්‍යශාලාවේ දී ඔහු මියගියේය. හෙනහන්ගේ මිනීමැරුම තුල, වෘත්තීය ඝාතනයක සියලු ලක්ෂන ගැබ්ව ඇත. එය සිදුකල නිපුන කුවක්කුකරුවෝ එම කටයුත්ත පැවත්වෙමින් තිබූ පරිශ්‍රයට ඇතුලුවී කිසිදු හේතුවකින් තොරව හෙනහන්ට වෙඩි තැබූහ. නිව් යෝර්ක් නාගරික මාධ්‍ය විසින් මෙම ප්‍රහාරය "ඉව බව නැති මිනීමැරුමක්"

ලෙස වහාම ලේබල් ගැසූ අතර, පොලිසිය කිසිදු පරීක්ෂනයක් පැවැත්වීම ප්‍රතික්ෂේප කලේය. ඝාතකයන් දෙදෙනා ඇසින් දුටු සාක්ෂිකරුවන් විසින් හඳුනාගෙන තිබුනු නමුත්, ඔවුන් අත්අඩංගුවට ගැනීමට පොලීසිය කිසිදු උත්සාහයක් නොදැරීය. ටොම් හෙනහන් ඝාතනය වාර්තා කිරීමෙන් හා හෙලාදැකීමෙන් වැලකී සිටීම මඟින් පැබ්ලෝවාදීහු පොලීසියේ අක්‍රියාකාරිත්වයට උඩගෙඩි දුන්හ. ඝාතකයන් අත්අඩංගුවට ගැනීමට බලකිරීම පිටුපස මහජන සහාය පෙලගැස්වීමට ව'කර්ස් ලීගය ස්වාධීන දේශපාලන උද්ඝෝෂනයක් දියත් කලාය. මෙම උද්ඝෝෂනයේ දී, මිලියන ගනනක් කම්කරුවන් නියෝජනය කල වෘත්තීය සමිති සංවිධාන නියෝජිතයෝ ද, දස දහස් ගනන් කම්කරුවෝ ද ව'කර්ස් ලීගයේ ඉල්ලීම අනුමත කරමින් පෙත්සම්වලට අත්සන් තැබූහ. අවසානයේ දී 1980 ඔක්තෝබරයෙහි පොලීසිය මෙම මහජන බලපෑමට හිස නමමින්, ඇන්ජිලෝ ටෝරෙස් හා එඩ්වින් සික්විනෝ යන ඝාතකයන් අත් අඩංගුවට ගත්හ. 1981 දී ඔවුන්ගේ නඩු විමසීම පවත්වන ලදී. වරදකරුවන් වූ ඔවුහු දිගු කලකට බන්ධනාගාර ගත කෙරිනි. කෙසේවුව ද වරදකරුවන්, පාපෝච්චාරනය නොකල අතර. සිය ක්‍රියාවට හේතු පැහැදිලි කලේ ද නැත.

## මතු සම්බන්ධයි

## සටහන්

95 .හජාජාක නිකුත් කල වාර්තාව මෙසේ සඳහන් කලේය. '' වයස අවුරුදු 12 සිට ඇයගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් වන තෙක් නැන්සි ෆීල්ඩ්ස්, හදාවඩා ගත්තේ ද, අධ්‍යාපනය හා මුදල් හදල් ලබා දුන්නේ ඇල්බර්ට් හා ගිග්ස් මොරිස් යන ඇගේ මාමා හා නැන්දාය. ඇල්බර්ට් මොරිස් සීඅයිඒ සංවිධානයේ වොෂින්ටන්හි පරිගනක මෙහෙයුම් අංශයේ ප්‍රධානියා මෙන්ම අයිබීඑම් හි විශාල කොටස් හිමියෙකි. ඔහු සීඅයිඒ හි පූර්ව සංවිධානය වූ ඕඑස්එස් හි සාමාජිකයෙක් ද, අධිරාජ්‍යවාදයේ ඒජන්තයෙක් ලෙස පෝලන්තයේ සේවය කල අයෙක් ද වේ. 1960 ගනන්වල මේන්හි ඔවුන්ගේ නිවසට නිතර පැමිනි අමුත්තෙකු වූ රිචර්ඩ් හෙම්ස් සීඅයිඒ හි හිටපු අධ්‍යක්ෂක හා දැන් ඉරානයේ එක්සත් ජනපද තානාපති ය. (ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරයේ ලියවිලි) 1985 කම්කරු ප්‍රකාශන, නිව් යොර්ක්, 15 වන පිටුව.

96 .ධනවාදයේ ලෝක ආර්ථික- දේශපාලන අර්බුදය හා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මරලතෝනිය. (නිව්යෝර්ක් කම්කරු ප්‍රකාශන,1979) 30 වන පිටුව.

97 .එම, 36වන පිටුව.

98 ."හීලිගේ අපෝහකයේ රහස" ඉන්ටර්කොන්ටිනෙන්ටල් ප්‍රෙස්, 1975 මාර්තු 31.

99 .දෙවන ලෝක යුද්ධය තුල සමාජවාදී කම්කරු පක්ෂය. කථා හා ලිපි. 1940-43 (පාත් ෆයින්ඩර් මුද්‍රනාලය 1975) 81-82 පිටු.

100 *.Documents of security and the Fourth International,* ආරක්ෂාව හා හතරවන ජාත්‍යන්තරයේ ලේඛන, 115 වන පිටුව.

101 .As We Knew Him අප දන්නා ජේම්ස් පී. කැනන් නිව් යෝර්ක් පාත්ෆයින්ඩර් ප්‍රෙස්1976 පි. 233

102 .ගෙල්ෆාන්ඩ් නඩුව, වෙලුම ii (නිව් යෝර්ක් පාර්ත්, පාත්ෆයින්ඩර් ප්‍රෙස් 1985, පි. 635.

103 . *Intercontinental Press,* ඉන්ටර්කොන්ටිනෙන්ටල් ප්‍රෙස්, 1977 ජූනි 20.

© www.wsws.org